රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :08/2009

මගේ අංකය: EST-08/CABPA/06/III
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07
2009 අප්‍රේල් මස 28 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

## කාර්යාල සේවක සේවයේ I පන්තියේ නිලධාරීන්ට
## <u>නිල ඇඳුම් ලබාදීම</u>

කාර්යාල සේවක සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව නියමිත සේවාකාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව I පන්තියට උසස් කර ඇති නිලධාරීන්ට එම පන්තියට අයත් රාජකාරි පවරා නොමැති අවස්ථාවක පහත සඳහන් කොන්දේසිවලට යටත්ව කාර්යාල කාර්ය සහායක නිලධාරීන් සඳහා හිමි නිල ඇඳුම් ලබාදිය යුතු බවට රජය තීරණය කර ඇත.

I. කාර්යාල සේවක සේවයේ I පන්තියට පත්කර ඇතත් II පන්තියේ තනතුරක සේවයේ යොදවා ඇත්නම් අදාල අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි එකී නිලධාරීන්ටද කාර්යාල කාර්ය සහායකවරුන්ට හිමි නිල ඇඳුම් ලබාදීම.

II. රාජකාරි කටයුතු සඳහා නිල ඇඳුම් ලබාදී ඇති නිලධාරීන් එකී නිල ඇඳුම් පැළඳ සිටීද යන්න පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානීන් පුද්ගලික අවධානය යොමු කිරීම.

02. නිල ඇඳුම් සපයා ඇති සියලුම රාජ්‍ය නිලධාරීන් රාජකාරි වේලාව තුල නිල ඇඳුම් නොපළඳින්නේ නම් 1991.08.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/91 හි විධිවිධාන අනුව ක්‍රියා කළ යුතුය.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිව නිකුත් කරන ලදි.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය